**සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය**

**පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය - I කොටස**

**10 ශ්‍රේණිය**

**I වාර පරීක්ෂණය - 2013**

පැය 1/2

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1-5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.

1. ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම ලෙස සැලකෙන්නේ,
   (i) ස්පාටා (ii) ඇතැන්ස් (iii) රෝමය (iv) එංගලන්තය

2. ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ස්වරූප ගණන කීයද?
   (i) එකකි (ii) දෙකකි (iii) තුනකි (iv) හතරකි

3. "ප්‍රජාතන්ත්‍රවාදය දේශපාලන දර්ශනයකි" යන්න පවසන ලද්දේ,
   (i) සීලර් (ii) ලවෙල් (iii) ඒබ්‍රහම් ලින්කන් (iv) විශ්ව කෝෂය

4. කිසියම් නීතියක් ආරම්භ කිරීමට ජනතාවට ඇති හැකියාව,
   (i) ජනමත විචාරණයයි (ii) ප්‍රාරම්භනයයි
   (iii) පුනරාවර්තනයයි (iv) ජ්‍යෙෂ්ඨසයිට ක්‍රමයයි

5. නීතියට අනුව පාලනය කිරීම යනු,
   (i) ස්වාධිපති බලයයි (ii) පරමාධිපත්‍යය බලයයි
   (iii) නීතියේ ආධිපත්‍යයයි (iv) දඬුවම් ලබා දීමයි

- **අංක 6-10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුලින් තෝරා ලියා දක්වන්න.**

6. සර්වජන ඡන්ද බලය මගින් ...................... කැමැත්ත පිළිගනී. (සුළුතර, බහුතර, බාලවයස්)
7. ෆෙඩරල් ක්‍රමයේදී මධ්‍යම ආණ්ඩුවේ බලය ................................ ක්‍රියාත්මක වේ. (බෙදා හැරීම, ඒකාධිපති කිරීම, ශූන්‍ය කිරීම)
8. එක් .................................... එක් රාජ්‍යයක් යන සංකල්පය මූලික වීමෙන් ජාතික රාජ්‍ය බිහි වේ. (ජාතියකට, මහාද්වීපයකට, සාගරයකට)
9. ශ්‍රී ලංකාවේ පාලක පාලිත දෙපක්ෂය .................................... අනුව කටයුතු කළ යුතුයි. (බහුජාතික, සමාගම්වලට, සංවර්ධිත රටවලට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට)
10. ඇමරිකානු විප්ලවය සිදුවූයේ ........................... වර්ෂයේදිය. (1688, 1776, 1789)

- **අංක 11-20 දක්වා ඇති වගන්ති කියවා නිවැරදි නම් √ ලකුණ ද වැරදි x නම් ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

11. ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම නිදහස, සහජීවනය හා අයිතිවාසිකම්ය. ( )
12. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ඊශ්‍රායලය, නවසීලන්තය හා බ්‍රිතාන්‍යය යන රටවල ක්‍රියාත්මක විය. ( )
13. කිසියම් දේශපාලන ප්‍රශ්නයක් නිරාකරණය කර ගැනීම සඳහා ජනතාවගේ අදහස් විමසීම පුනරාවර්තනයයි. ( )
14. රුසියානු විප්ලවය 1917 දී සිදුවිය. ( )
15. රටක මූලික නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. ( )
16. දේශපාලන විධායකය යනු සත්‍ය විධායකයි. ( )
17. පැරණි ලිබරල්වාදය ඉදිරිපත් කළ චින්තකයින් අතර තෝමස් ජෙෆර්සන් හා හොබ්හවුස් ප්‍රධාන වේ. ( , )
18. ඇමරිකා එක්සත් ජනපදයේ විධායකයෙහි නිල කාලය වසර 4 කි. ( )
19. 1948 දී මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ඉදිරිපත් කරන ලදී. ( )
20. කොංග්‍රස් මණ්ඩලය නමින් හඳුන්වන්නේ එක්සත් ජනපද ව්‍යවස්ථාදායකයයි. ( )

- **අංක 21-25 දක්වා වගන්ති සඳහා අදාළ වර්ෂ ගලපන්න.**

| | |
|---|---|
| 21. රුසියානු විප්ලවය | 1688 |
| 22. මානව අයිතිවාසිකම් ප්‍රකාශනය | 1917 |
| 23. ඉංග්‍රීසි විප්ලවය | 1948 |
| 24. ප්‍රංශ විප්ලවය | 1776 |
| 25. ඇමරිකානු විප්ලවය | 1789 |

සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය

පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය - II කොටස

10 ශ්‍රේණිය

I වාර පරීක්ෂණය - 2013

පැය 1½

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය ප්‍රශ්නයකි.**
- **තවත් ඕනෑම ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

(1) 1. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සීලර්ගේ නිර්වචනය ලියා දක්වන්න.
2. ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූප දෙක නම් කරන්න.
3. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වූ ග්‍රීසියේ පැවති පෞර හෙවත් නගර රාජ්‍ය දෙකක් නම් කරන්න.
4. රාජ්‍යයක ප්‍රධාන අංග දෙකක් නම් කරන්න.
5. මානව හිමිකම් දිනා ගැනීමට කරන ලද අරගල දෙකක් නම් කරන්න.
6. මැතිවරණ කොට්ඨාශ නිර්ණය කිරීමේදී යොදා ගන්නා ලද නිර්ණායක දෙක නම් කරන්න.
7. ද්වි පක්ෂ ක්‍රමයක් ඇති රටවල් දෙකක් නම් කරන්න.
8. දේශපාලන අයිතිවාසිකම් දෙකක් ලියන්න.
9. ලොව මුල්ම ජාතික රාජ්‍ය දෙක නම් කරන්න.
10. ද්විත්ව විධායකය නම් කරන්න.

(2x10=20)

(2)
1. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මැතිවරණ ක්‍රම හතරක් ලියන්න. (ලකුණු 2)
2. මැතිවරණ නිසි කලට පැවැත්වීමෙහි වැදගත්කම කරුණු තුනකින් දක්වන්න.(ලකුණු 3)
3. සදාචාරාත්මක යුතුකම් පහක් නම් කරන්න. (ලකුණු 5)

(3)
1. ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරන රටවල් දෙකක් ලියන්න. (ලකුණු 2)
2. ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම දක්වන්න. (ලකුණු 3)
3. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(4)
1. පැරණි ලිබරල්වාදය ඉදිරිපත් කළ චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න.(ලකුණු 2)
2. ලොව පවතින ප්‍රධාන පක්ෂ වර්ග තුන නම් කරන්න. (ලකුණු 3)
3. මානව අයිතිවාසිකම් පහක් දක්වන්න.(ලකුණු 5)

(5)
1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු කුමක්ද? (ලකුණු 2)
2. එහි ඇතුලත් මූලික කරුණු තුනක් දක්වන්න. (ලකුණු 3)
3. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 5)

(6)
1. ජාතික රාජ්‍යයක් යන්න හඳුන්වන්න.(ලකුණු 2)
2. ජාතික රාජ්‍ය නිර්මාණයේ දී බලපෑ කරුණු තුනක් ලියන්න. (ලකුණු 3)
3. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ලක්ෂණ යහපත් ජීවන ක්‍රමයකට ද උදව් කර ගත හැකි අන්දම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)